සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය **ක්‍රිස්තු ධර්මය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ජේසුස් වහන්සේ යාච්ඤා කිරීම සඳහා ගෙත්සෙමනට ගියේ කවුරුන් සමගින්ද?

(1) පේදුරු, ජාකොබ්, ජොහන් ය. (2) පේදුරු, ජාකොබ්, ඇන්ඩෲ ය.

(3) පේදුරු, ජාකොබ්, තෝමස් ය. (4) පේදුරු, ජාකොබ්, ජුදස් ය.

02. 'සියල්ල නිම විය' මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ,

(1) පළමු වචනය යි. (2) තුන්වන වචනය යි.

(3) හයවන වචනය යි. (4) හත්වන වචනය යි.

03. මුල් කිතුනු සභාවේ ලක්ෂණයක් නොවන්නේ,

(1) සහභාගීකම ය. (2) ආත්මාර්ථකාමී බව ය.

(3) යාච්ඤාව ය. (4) ඉගැන්වීම ය.

04. අපේ හැකියාවන් වර්ධනය කර ගත හැකි බවට ජේසු තුමා ඉගැන්වූ උපමා කථාව වන්නේ,

(1) වපුරන්නාගේ උපමාව ය. (2) නැති වූ කාසිය පිළිඳ උපමාව ය.

(3) රන්කාසි දහස පිළිබඳ උපමාව ය. (4) මුහුන් පිළිබඳ උපමාව ය.

05. බයිබලය ලිවීමට ගත වූ කාලය

(1) අවුඃ 50 කි. (2) අවුඃ 100 කි.

(3) අවුඃ 500 කි. (4) අවුඃ 1000 කි.

- **අංක 06 - 10 දක්වා දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

06. පාස්කු මංගල්‍යයට දින 10 කට පසු පෙන්තකොස්ත මංගල්‍යය පවත්වනු ලැබී ය. ( )

07. මනස්ථාපනයේ දූත මෙහෙවර ඉටු කරනු ලැබුවේ ස්නාවක ජොහන් තුමා ය. ( )

08. ක්ලෞදියස් රජුගේ කාලයේ ලොව පුරා සාගතයක් ඇති විය. ( )

09. අපට සතුරුකම් කරන අයට අප පෙරලා පහර දිය යුතු ය. ( )

10. ශ්‍රී ලංකා බයිබල් සමාගම ආරම්භ කරන ලද්දේ 1812 වර්ෂයේ දී ය. ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| 11. බයිබලයෙක් ලබා ගැනීමට වෙහෙස වූයේ | ඇඳහිල්ල ය. |
| 12. ජේසු තුමා බීමට ජලය ඉල්ලුවේ | මිනිසා ය. |
| 13. 'බිබ්ලියා' යන්නෙහි අර්ථය වන්නේ | මේරි ජෝන්ස් ය. |
| 14. කිතුනු ජීවිතයේ පදනම වන්නේ | පොත් ය. |
| 15. දෙවියන් වහන්සේ දූවිල්ලෙන් නිර්මාණය කළේ | සමාරිය ස්ත්‍රීයගෙන් ය. |

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ වල හිස්තැන තුළ දී ඇති පිළිතුර යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

( නිහතමානීකම / පර්වතය / දේව වචනය / ජොහන් / තෝමස් )

16. ජේසුස් වහන්සේ පරීක්ෂාවන්ට නොබියව මුහුණ දුන්නේ ........................................................................ තුළිනි.

17. ජේසු තුමාගේ ආශිර්වාදය අපට ලබා ගැනීමට අප තුළ ................................................................ තිබිය යුතු ය.

18. දේව වචනය අසා එය පිළිපදින අය ........................................................................ මත ගෙය සෑදූ මිනිසාට සමාන ය.

19. ජේසු තුමාගේ උත්ථානය අවිශ්වාස කළ ගෝලයා වන්නේ ........................................................................ ය.

20. ජේසු තුමාගේ මව භාර දුන්නේ ........................................................................ නමැති ගෝලයාට ය.

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) දෙවියන් වහන්සේ මිනිසාට මැවිල්ල භාර දී දුන් වගකීම් 02 ක් ලියන්න.
(ii) සාමාන්‍ය ජීවිතයේ දී ඔබට එල්ල වන පරීක්ෂාවන් 02 ක් ලියන්න.
(iii) බයිබලයේ සඳහන් 'රන් අණ' ලියන්න.
(iv) මුල් කාලයේ ශුද්ධ ලියවිල්ල ලියා තැබීමට භාවිතා කළ දේවල් 02 ක් ලියන්න.
(v) මේරි ජෝන්ස් බයිබලයක් ලබා ගැනීම සඳහා මුදල් උපයා ගත් ක්‍රම 02 ක් ලියන්න.
(vi) මුල් කිතුනු සභාවේ ලක්ෂණ 02 ක් ලියන්න.
(vii) 'රන් වත් රිදී වත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි.' මෙසේ ප්‍රකාශ කළේ කවුද? කාටද?
(viii) කිතුනු දරුවෙකු ලෙස ඔබ වර්ධනය කර ගත යුතු ගුණාංග 02 ක් ලියන්න.

02. (i) ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීමට ආසන්න සිදුවීම් 02 ක් ලියන්න.
(ii) ජේසුස් වහන්සේ රොටී සහ කුසලාන රැගෙන පැවසූ වදන් ලියන්න.
(iii) දුක් ප්‍රාප්තියට පෙර සිදුවීම් වලින් අපට ඉගන ගත හැකි කරුණු 03 ක් ලියන්න.

03. (i) පෙන්තකොස්ත දින සිදුවීම් ඇතුලත් බයිබලයේ පොත නම් කරන්න.
(ii) පෙන්තකොස්ත දින සිදු වූ විශේෂ සිදුවීම් 03 ක් ලියන්න.
(iii) ශුද්ධාත්ම බලය ලැබීම කරණකොට ගෙන කිතුනුවෙකු ලෙස ශුද්ධ සභාවේ වර්ධනය සඳහා ඔබට කළ හැකි දේවල් 03 ක් කෙටියෙන් විස්තර කරන්න.

04. (i) අප රටට බලපාන ස්වභාවික විපත් 02 ක් ලියන්න.
(ii) ස්වභාවික විපත් අවස්ථා වලදී ඔවුන් වෙනුවෙන් ඔබට කළ හැකි උපකාර 03 ක් ලියන්න.
(iii) විපත් අවස්ථාවක එයට මුහුණ දුන් අය වෙනුවෙන් යාච්ඤාවක් ලියන්න.

05. (i) ජේසුස් වහන්සේ ජීවත් වූ සමාජයේ කොන් කළා වූ ජන කොටස් 02 ක් නම් කරන්න.
(ii) 'ළදරුවන් මා වෙත එන්න ඉඩ දෙන්න. ඔවුන් වළක්වන්න එපා.' මෙම ප්‍රකාශය කළේ කවුද? කාටද? කුමන අවස්ථාවේද?
(iii) ඔබ පන්තියේ පිළිගැනීමට ලක් නොවූ අයෙකු වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න.

06. (i) ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ වදන් ගණන කීයද?
(ii) ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ පළමු වචනය ලියා දක්වන්න.
(iii) ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ වදන් තුළින් ඔබ ඉගෙන ගත් කරුණු 03 ක් ලියන්න.

**07 ශ්‍රේණිය** **තෙවන වාර පරීක්ෂණය 2018** **ක්‍රිස්තු ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 3 ) 03. ( 2 ) 04. ( 3 ) 05. ( 4 ) 06. (X) 07. (✓) 08. (✓) 09. (X) 10. (✓)

11. මේරි ජොන්ස් 12. සමාරිය ස්ත්‍රියගෙනි. 13. පොත් 14. ඇදගිල්ල 15. මිනිසා
16. දේව වචනය 17. නිහතමානිකම 18. පර්වතය 19. තෝමස් 20. ජොහන්

## II කොටස

01. (i) ♦ දරු සම්පත් ලැබීම. ♦ ආරක්ෂා කිරීම, පාලනය කිරීම. ♦ නිසි ප්‍රයෝජන ගැනීම. ♦ වර්ධනය කිරීම.

(ii) ♦ සොරකම් කිරීමට පෙළඹවීම. ♦ විභාග වලදී කොපි කිරීම. ♦ අන්අයට පීඩා කිරීම. ♦ අන් අයට ගැරහීම.

(iii) අනුන් ඔබට යමකත් කරනවාට ඔබ කැමතිද ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න.

(iv) පැපිරස් පත් / ගල් පුවරු

(v) ♦ දර විකිණීම ♦ බිත්තර විකිණීම ♦ මී මැසි පෙට්ටියක් නඩත්තු කිරීම.

(vi) ♦ ඉගැන්වීම. ♦ සහභාගීකම ♦ රොටී කැඩීම ♦ යාච්ඤාව ♦ සියල්ල පොදුවේ තබා ගැනීම.

(vii) පේදුරු විසින් සුදර්ශන දොරටුව අසල සිටි කොරාට

(viii) කරුණාව, ප්‍රේමය, ආදරය, කමාව දීම. (ල. 2x8=16)

02. (i) ♦ අන්තිම රාත්‍රී භෝජනය ♦ ශ්‍රාවකයින්ගේ පාද සේදීම ♦ ගෙත්සෙමෙනෙහි යාච්ඤාව. (ල. 02)

(ii) රොටී රැගෙන - රැගෙන වළඳන්න. මේ මාගේ ශරීරයයි.

කුසලාන රැගෙන - ඔබ සියල්ලෝම මෙයින් පානය කරන්න. මෙය පව් කමාව පිණිස බොහෝ දෙනෙකු උදෙසා වගුරවන මාගේ ගිවිසුම රුධිරය වේ. (ල. 03)

(iii) නිහතමානිකම / උස් පහත්කම් නොබලා ක්‍රියා කිරීම / යාච්ඤාවට මුල් තැන දීම / දේව කැමැත්ත නිරතුරුවම සොයා බැලීම.... (ල. 06)

03. (i) ක්‍රියා පොත. (ල. 02)

(ii) සැඩ සුළඟක් හැමීම / ගිනි දලු වැනි දිව් / අන්‍ය භාෂා වලින් කථා කිරීම. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු වලට ලකුණු දෙන්න. (ල. 06)

04. (i) සුනාමි / සුළි සුළං / භූමි කම්පා / නියඟ / ගං වතුර (ල. 02)

(ii) මුදල් අධාර ලබා දීම / ශ්‍රමයෙන් උපකාර කිරීම / ඔවුන් ආදරයෙන් පිළි ගැනීම / ඔවුන්ට සවන් දීම. (ල. 03)

(iii) ලියා ඇති යාච්ඤාවට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) සමාරිතයන් / රෝගීන් / ළදරුවන් / කාන්තාවන් (ල. 02)

(ii) ජේසුස් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට කාන්තාවන් තම ළදරුවන් ආශිර්වාද කර ගැනීම ජේසු තුමා වෙත පැමිණි විට ඔවුන් එළවා දැමූ අවස්ථාවේ. (ල. 03)

(iii) ඇයට / ඔහුව ආදරයෙන් පිළිගැනීම / පෑනක් ලබා දීම / ආහාර ලබා දීම / පාඩම් කියා දීම ආදී.... (ල. 06)

06. (i) හතයි. (ල. 02)

(ii) පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දේ ඔවුහු නොදනිති. (ල. 03)

(iii) සතුරන්ට සමාව දීම / කීකරු කම / දෙවිඳුන්ට මුල් තැන දීම / දෙමව්පියන් ආදරයෙන් රැක බලා ගැනීම. (ල. 06)